FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
# ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
# Media Freedom Rights Monitoring Report

MFRMD

2021 - කලාප අංක 03 - මාර්තු

## මාධ්‍ය නිදහස සහ අනුලංඝනීය පුරවැසි අයිතීන්

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් 2021 ජනවාරි මස මාසිකව නිකුත් කිරීම ආරම්භ කළ, මාධ්‍ය නිදහස - නිරීක්ෂණ වාර්තාවේ තුන් වැනි කලාපයයි මේ. ජාත්‍යන්තරව පිළිගැනීමක් සහිත මාධ්‍ය නිදහස සම්බන්ධ දස වැදෑරුම් අයිතීන් සැලකිල්ලට ගනිමින්, වාර්තා වන සිදුවීම් සංරචක හතකට ගොනු කරමින් මෙම මාසික වාර්තාව සකස් වේ. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිත බව නම් වූ සංරචකය යටතේ සෘජුව ආරක්ෂාවට අදාළ නොවන බව පෙනෙන නමුත් අදහස් ප්‍රකාශ කිරීමේ, සංචරණයේ හා නිදහසේ තොරතුරු සොයා යෑමේ අයිතීන් උල්ලංඝනය වූ සිදුවීම් සම්බන්ධ නිරීක්ෂණ ද අන්තර්ගත කොට ඇත. ඒවා අනියමින් මානසික හිංසනයන්ට අයත් වන බව පිළිගැනීමට සිදුවේ. මාධ්‍ය නිදහස සම්බන්ධ දස වැදෑරුම් අයිතීන්ගෙන් කොටසක් මාධ්‍යවේදීන්ට පමණක් නොව මානව හිමිකම් ක්‍රියාධරයන්, අකටයුතු නාදකයින් ඇතුළු පුරවැසියන්ගේ අයිතීන්වලට ද අදාළය. ඒ අනුලංඝනීය අයිතීන් ද මෙහිදී සැලකිල්ලට ගෙන ඇත. අප පළමු කලාපයේදී වාර්තා කළ ආකාරයට මාධ්‍ය නිදහස සම්බන්ධ 2020 වාර්ෂික වාර්තාව ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය වෙනුවෙන් නිකුත් කිරීමට නියමිතය.

මෙම වාර්තාව පෝෂණය කිරීමේදී ඔබගේ අදහස් ඉතා වැදගත් බව මතක් කරමි.

**සීතා රංජනී**
කැඳවුම්කරු

මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම් හා පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන්/පසු විපරම් සම්බන්ධ කෙටි වාර්තා කිරීමක් මාධ්‍ය නිදහස සම්බන්ධ නිරීක්ෂණ වාර්තාවට ඇතුළත් වන අතර, ඒවාට අදාළව කෙටි නිරීක්ෂණද සටහන් කරයි. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්ද මෙහිදී අදාළ කර ගෙන ඇත. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂයපථයට/සංරචකයන්ට අදාළ නව සිදුවීම් 13ක් 2021 මාර්තු මාසය තුළ නිරීක්ෂණය විය. සිදුවීම් 03කට අදාළව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් ප්‍රවෘත්ති නිවේදන නිකුත් කරන ලද අතර එක් සිදුවීමකට අදාළව සහෝදර මාධ්‍ය සංවිධාන 5ක් සමඟ එක්ව ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කෙරිණි.

## මාර්තු මාසය තුළ වාර්තා වූ නව සිදුවීම්

1. බීබීසී දෙමළ වෙබ් අඩවියේ වාර්තාකරු රංජන් අරුන් ප්‍රසාද් පිටුපස නාඳුනන පුද්ගලයන් ලුහුබැඳීම.
2. අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීතිය කුමක්දැයි නිසි ලෙස අර්ථ නිරූපනය කරන ලද නීතියක් සම්පාදනය කරන ලෙස ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය අධිකරණ අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටීම.
3. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත ප්‍රතිසංවිධානයට දැඩි ලෙස විරෝධය පළ කරමින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යවන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය එම පනත අහෝසි කළ යුතු බව අවධාරණය කිරීම.
4. නිදහස් මාධ්‍යවේදියකු හා මානව හිමිකම් ක්‍රියාධරයකු වන රුකී ප්‍රනාන්දු සහ තවත් මාධ්‍යවේදීන් දෙදෙනකුට උතුරු පළාතේ, කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ඉරණතිව් දූපතට පිවිසීමට නාවික හමුදාව ඉඩ නොදීම.
5. ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් අහිම්සා වික්‍රමතුංග විසින් වොෂින්ටන් පෝස්ට් පුවත්පතට ලියූ ලිපියක් 'ශ්‍රී ලංකාව විනාශ කිරීමේ උත්සාහයක්' ලෙස විදේශකටයුතු ලේකම්වරයාගේ සහ ජනමාධ්‍ය ඇමතිවරයාගේ විවේචනයට ලක්වීම.
6. තමන් පැහැරගැනීමට හා වධහිංසාවලට ලක් වූ බවට පොලිසියට පැමිණිල්ලක් කළ සියරට වෙබ් අඩවියේ මාධ්‍යවේදී සුජීව ගමගේට එරෙහිව පොලිසිය විසින් අධිකරණ ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීම.
7. 2021 මාර්තු 12 දරන ගැසට් පත්‍රය මගින්, 2021 අංක 1 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (දැඩි අන්තවාදී ආගමික මතවාද දැරීමෙන් මුදවා ගැනීමේ) නියෝග ප්‍රකාශයට පත් කිරීම.

8. සිංහරාජයට ආසන්නයේ සිදු වන පරිසර විනාශයක් ගැන රූපවාහිනී වැඩසටහනකදී අදහස් පළ කළ භාග්‍යා අබේරත්න තරුණිය පොලිසියේ ප්‍රශ්න කිරීමට ලක් වීම.

9. ෆේස්බුක් සමාගම, ආයතනික මානව හිමිකම් ප්‍රතිපත්තියක් සහ මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට ආධාර කිරීමේ අරමුදලක් ප්‍රකාශයට පත් කිරීම.

10. 2021 මාර්තු 19 වැනිදාට යෙදී තිබුණු ගෝලීය දේශගුණික විපර්යාස දිනය සැමරීම වෙනුවෙන් කොළඹ විහාරමහාදේවී උද්‍යානයේ සවි කර තිබූ චිත්‍රයක්, පොලිස් පරිසර කොට්ඨාසයේ සහ කොළඹ නාගරික කොමසාරිස්වරියගේ මැදිහත්වීමෙන් ගලවා ඉවත් කිරීම.

11. උදයන් පුවත්පතේ කළමනාකාර අධ්‍යක්ෂ සරවනපවන් සහ සහ එම කාර්යමණ්ඩලයේ කේ. දිලිප් අමුතන් යන දෙදෙනා, යාපනය මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පැවති නඩුවක චූදිත තත්ත්වයෙන් නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කිරීම.

12. මාර්තු 20 වැනිදා නුවරඑළියේ පැවැති ගම සමඟ පිළිසඳර වැඩ සටහනට සහභාගී වෙමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනමාධ්‍යවලට කළ අනතුරු ඇඟවීම.

13. යාපනය නගරයේ නාවර් වීදියේ පිහිටි tubetamil යූ ටියුබ් නාලිකාව සහ www.tubetamil.com වෙබ් අඩවියේ කාර්යාලය වටලා එම මාධ්‍යවලට සම්බන්ධ දෙදෙනෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම.

**වගු අංකඃ 01 වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 මාර්තු**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 07 |
| 02 | නිතීමය කොන්දේස | 05 |
| 03 | ජනමාධ්‍යයට අදාළ වැදගත් ප්‍රවණතා | 01 |
| | **එකතුව** | **13** |

## මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ අත්‍යවශ්‍ය සාධකයකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. මෙම මූලික නිදහසට අභියෝග එල්ල වූ සිදුවීම් 07ක් මාර්තු මාසය තුළ නිරීක්ෂණය විය. සෘජුව මාධ්‍ය වෘත්තිකයන් මුහුණ පෑ සිදුවීම් මෙන්ම මාධ්‍ය ඔස්සේ අදහස් පළ කිරීම හේතුවෙන් පුරවැසියන් මුහුණ පෑ සිදුවීම්ද ඊට ඇතුළත්ය. චිත්‍රයක් මගින් අදහස් ප්‍රකාශ කිරීමට ඇති නිදහස අභියෝගයට ලක් වූ අවස්ථාවක්ද ඒ අතර වෙයි. ජනාධිපතිවරයා විසින් මාධ්‍ය ආයතනවලට එරෙහිව කළ තර්ජනාත්මක ප්‍රකාශය මේ අතරින් වඩාත් අවධානයට ලක් වූ කාරණයකි.**

**වගු අංකඃ 02 - 2021 මාර්තුඃ මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 07**

| අංකය | සිදුවීම | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | තර්ජනය කිරීම | 01 |
| 02 | සංවරණයේ සහ තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිය | 01 |
| 03 | ප්‍රකාශනයේ අයිතිය අහිමි කිරීම | 01 |
| 04 | පැහැරගෙන යෑම හා ශාරීරික හිංසනය | 01 |
| 05 | මානසික හිංසනය | 03 |
| | **එකතුව** | **07** |

## මාසය තුළ නව සිදුවීම්:

01. **බීබීසී දෙමළ වෙබ් අඩවියේ වාර්තාකරු රංජන් අරුන් ප්‍රසාද් පිටුපස නාඳුනන පුද්ගලයන් ලුහුබැඳීම.**

සැකකටයුතු පිරිසක් තම තොරතුරු සොයා සැරිසරන බවටත්, වෘත්තීය කටයුතු සඳහා උතුරේ කළ සංචාරයකදීද පිරිසක් තමන් ලුහුබැඳ ආ බවටත් බීබීසී දෙමළ වෙබ් අඩවියේ වාර්තාකරු රංජන් අරුන් ප්‍රසාද් මාර්තු 03වැනිදා පොලිස් මූලස්ථානයට පැමිණිලි කර ඇත.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් චර්යාව පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව විසින් සිදු කරමින් පවතින සාකච්ඡාව සම්බන්ධයෙන් උතුරේ ජනතාවගේ අදහස් ඇතුළත් වාර්තාවක් බීබීසී දෙමළ වෙබ් අඩවියේ පළ කිරීමෙන් පසුව මෙම තත්වය උද්ගත වූ බව ඔහු කියා සිටී.

අරුන් ප්‍රසාද් ප්‍රකාශ කරන පරිදි, අදාළ වාර්තාව පළ වීමෙන් පසු මාර්තු 01 වැනිදා ඔහුගේ නිවස පිහිටි රක්වාන ප්‍රදේශයේ සැරිසරා ඇති පිරිසක් සහ මාර්තු 02 වැනිදා නුවර ප්‍රදේශයේ පිහිටි ඔහුගේ බිරිඳගේ නිවසට පැමිණි දෙදෙනකු ඔහු පිළිබඳව තොරතුරු විමසා තිබේ. මාධ්‍යවේදියා කළ පැමිණිල්ල සම්බන්ධයෙන් පොලිසිය මේ වන තුරු කිසිදු පියවරක් ගෙන නැත.

02. **රුකී ප්‍රනාන්දු සහ තවත් මාධ්‍යවේදීන් දෙදෙනකුට උතුරු පළාතේ, කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ඉරණතිව් දූපතට පිවිසීමට නාවික හමුදාව ඉඩ නොදීම.**

මාර්තු 05වැනිදා කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි ඉරණතිව් දූපතෙහි සංචාරයක නිරතවීමට ගිය මානව හිමිකම් ක්‍රියාකාරිකයකු හා නිදහස් මාධ්‍යවේදියකු වන රුකී ප්‍රනාන්දු හා තවත් ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකු දූපතට පිවිසීම වැළැක්වීමට නාවික හමුදාව කටයුතු කර තිබේ. එහෙත් ඒ සඳහා නීත්‍යානුකූල හේතුවක් ඉදිරිපත් කිරීමට බලධාරීන් අපොහොසත් වී ඇත. මේ පිළිබඳව කිළිනොච්චි දිසාපතිවරයා, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා සහ ජනමාධ්‍ය ඇමතිවරයාගෙන් කළ විමසීම්වලදී එම බලධාරීන් ප්‍රකාශ කර ඇත්තේ එබඳු තහනමක් පිළිබඳව නොදන්නා බවයි. එහෙත් නාවික හමුදා මාධ්‍ය නාවික හමුදා ප්‍රකාශක ඉන්දික ද සිල්වා MediaLK වෙබ් අඩවියට ප්‍රකාශ කර ඇත්තේ ඉරණතිව් දූපතට එහි පදිංචිකරුවන්ට හැර වෙනත් පුද්ගලයන්ට ඇතුළුවීම තහනම් කර ඇති බවයි.

මේ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් රුකී ප්‍රනාන්දු ප්‍රකාශ කරන්නේ නාවික හමුදාවේ නිලධාරීන්ගේ ක්‍රියාව නිසා සිය ව්‍යවස්ථාමය අයිතිවාසිකම්, විශේෂයෙන් සංචාරය කිරීමේ නිදහස (14 - 1- h වගන්තිය) සහ අදහස් පළ කිරීමේ හා ප්‍රකාශනයේ නිදහස (14-1-අ වගන්තිය) උල්ලංඝනය වී ඇති බවයි.

කිළිනොච්චි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නාවික හමුදාවට පදිංචිකරුවන්ගේ ලැයිස්තුවක් ලබා දී ඇති නමුත් කිසිවෙකු එහි යෑම තහනම් කර නොමැති බවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15වන වගන්තියට අනුව අදහස් ප්‍රකාශ කිරීමේ හා සංචාරය කිරීමේ නිදහස සීමා කළ හැක්කේ "නීතියෙන් නියම කර ඇති පරිදි" පමණක් බවත් එබැවින් මෙය මුළුමනින්ම නීති විරෝධී හා අත්තනෝමතික ක්‍රියාවක් බවත් ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි.

ප්‍රවේශ වීමට ගොඩබිම් මාර්ගයක් නොමැති ඉරණතිව් දූපතෙහි ධීවර ජනතාව පදිංචිව සිටින අතර, කොවිඩ් ආසාදිත මුස්ලිම් ජනතාවගේ මළ සිරුරු එම දූපතෙහි භූමදානය කිරීමට රජය විසින් ගනු ලැබූ තීරණයට එරෙහිව පදිංචිකරුවෝ අඛණ්ඩ විරෝධයක නිරතව සිටිති.

03. **ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් අහිම්සා වික්‍රමතුංග විසින් වොෂින්ටන් පෝස්ට් පුවත්පතට ලියූ ලිපියක් ශ්‍රී ලංකාව විනාශ කිරීමේ උත්සාහයක් ලෙස විදේශකටයුතු ලේකම්වරයාගේ සහ ජනමාධ්‍ය ඇමතිවරයාගේ විවේචනයට ලක්වීම.**

වසර 12කට පෙර සිදු වූ, සන්ඩේ ලීඩර් පුවත්පතේ කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳව මේ වන තුරු යුක්තිය ඉටු කිරීමට ශ්‍රී ලංකා රජය අපොහොසත්වීම සම්බන්ධයෙන්, අහිම්සා වික්‍රමතුංග (ඝාතනයට ලක්වූ කතුවරයාගේ දියණිය) විසින් ලියන ලද ලිපියක් 'My father was assassinated 12 years ago Sri Lanka's leaders are still denying us justice' හිසින් මාර්තු 02 වැනිදා Washington Post පුවත්පතෙහි පළ විය.

මේ පිළිබඳව දැඩි නිෂේධනීය ප්‍රතිචාරයක් විදේශකටයුතු අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල් ජයනාත් කොළඹගේ සහ ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල විසින් dailymirror.lk වෙබ් අඩවිය වෙත පළ කර තිබේ. විදේශකටයුතු ලේකම්වරයා ප්‍රකාශ කර ඇත්තේ, අහිම්සාගේ ලිපිය ශ්‍රී ලංකාවේ නායකයින්ට සංචාරක සීමා පැනවීම සහ සම්බාධක පැනවීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව පෙළගැස්වීමෙන් "ශ්‍රී ලංකාව විනාශ කර එහි පසුබෑම දැකීමට ගත් උත්සාහයක්" බවයි. (that it was an attempt to "destroy Sri Lanka and see its downfall" by rallying the international community to impose travel restrictions and embargoes on Sri Lankan leaders.)

රජයේ මාධ්‍ය ප්‍රකාශකවරයා ද වන ජනමාධ්‍ය ඇමතිවරයා ප්‍රකාශ කර ඇත්තේ, ඇය විපක්ෂ දේශපාලනඥයන් සහ ඩයස්පෝරා කණ්ඩායම්ද ඇතුළු ජාලයකින් පාලනය වන්නේ යැයි පෙනී යන බවයි. ("The public feels that she is tied to a string and is being controlled by certain parties," including opposition politicians and Diaspora groups") එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC) හමුවේ රට මුහුණ දෙන අභියෝගවලදී ඇය එසේ කිරීමට තීරණය කිරීම

කනගාටුදායක බවද ඇමතිවරයා පවසා ඇත.

තම පියා වෙනුවෙන් යුක්තිය ඉටු කිරීම වෙනුවෙන් හඬ නැඟීම හේතුවෙන් අදාළ බලධාරීන් විසින් ඇය රටට සතුරු තැනැත්තියක ලෙසත්, විවිධ බලවේග විසින් මෙහෙයවීම අනුව කටයුතු කරන්නියක ලෙසත් හංවඩු ගැසීමක් සිදු කර ඇති බව ඉහත ප්‍රකාශ අනුව පෙනී යයි. මෙය නිදහස් අදහස් ප්‍රකාශනය අධෛර්යමත් කරන හා එසේ අදහස් පළ කරන්නන්ට එරෙහිව සමාජය තුළ ද්වේෂයට ලක් කරනසුලු ප්‍රවේශයක් බව නිරීක්ෂණය කළ හැකිය.

04. **තමන් පැහැරගැනීමට හා වධහිංසාවලට ලක් වූ බවට පොලිසියට පැමිණිල්ලක් කළ මාධ්‍යවේදී සුජීව ගමගේට එරෙහිව පොලිසිය විසින් අධිකරණ ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීම**

සියරට වෙබ් අඩවියේ මාධ්‍යවේදියකු වන සුජීව ගමගේ විවිධ මුද්‍රිත හා අන්තර්ජාල ප්‍රකාශනවල කලක් තිස්සේ කටයුතු කර ඇති නිදහස් මාධ්‍යවේදියෙකි. මාර්තු 10 වැනිදා මීරිගම නගරයේදී කිසියම් පිරිසක් විසින් ඔහු පැහැරගෙන කළු පැහැති රථයකින් රැගෙන ගොස් යම් රහස්‍ය තොරතුරක් සහිත මෙමරි කාඩ්පතක් පිළිබඳව විමසමින් වධහිංසාවලට ලක් කළ බවත්, පසුව දෙමටගොඩ ප්‍රදේශයට ගෙනැවිත් අත්හැර දැමූ බවත් ඔහු ප්‍රකාශ කළේය. මෙම සිදුවීම සම්බන්ධයෙන් මාර්තු 17 වැනිදා නිවේදනයක් නිකුත් කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කළේ, මෙම සිදුවීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කර සත්‍යය අනාවරණය කිරීම රජයේ වගකීමක් බවයි.

හිංසනයට ලක් වීමෙන් සිදු වූ පිළිස්සුම් ඇතුළු තුවාල හේතුවෙන් කොළඹ ජාතික රෝහලට ඇතුළත් වූ ඔහු 17වැනිදා දක්වා එහි නේවාසිකව ප්‍රතිකාර ලැබූ අතර රෝහල් පොලිසියට අදාළ සිදුවීම පිළිබඳව පැමිණිලි කර තිබේ. රෝහලේ සිට නිවසට යෑමට සූදානම් වන විට කොළඹ පොලිස් අපරාධ කොට්ඨාසය (CCD) විසින් ඔහු අත්අඩංගුවට ගැනිණි. පසුව ව්‍යාජ පැමිණිල්ලක් කිරීමේ චෝදනාව මත කොළඹ මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කෙරුණු ඔහුට ඇප නියම විය. මාර්තු 19 වැනිදා ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමින් පොලිස් මාධ්‍ය ප්‍රකාශක නි. පොලිස්පති අජිත් රෝහණ පැවැසුවේ මාධ්‍යවේදියා පැවසූ සිදුවීම අසත්‍යයක් බවයි. ඔහු 09 වැනිදා තමන් විසින්ම නිවසේදී මේසන් හැන්දක් රත් කොට පුළුස්සාගෙන ඇති බව පැවසූ ඔහු ඒ සඳහා උපයෝගී කර ගත් බව කියන මේසන් හැන්දද ප්‍රදර්ශනය කළේය. මේ අතර සුජීව වෙනුවෙන් පෙනී සිටින නීතිඥ නාමල් රාජපක්ෂ මාධ්‍ය වෙත ප්‍රකාශ කළේ කොළඹ පොලිස් අපරාධ කොට්ඨාසයේදී සිය සේවාදායකයාගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට තමන්ට ඉඩ නොදුන් බවයි.

මාර්තු 21 වැනිදා ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමින් සුජීව ගමගේ පොලිසියේ චෝදනාව මුළුමනින්ම ප්‍රතික්ෂේප කළේය. අදාළ නඩුව මාර්තු 25 වැනිදා නැවත කැඳවූ අවස්ථාවේදී මාධ්‍යවේදියා යළි රිමාන්ඩ් භාරයට පත් කරන ලෙස කොළඹ පොලිස් අපරාධ කොට්ඨාසය විසින් කරන ලද ඉල්ලීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කෙරිණි. අදාළ නඩුව ජූලි 29 වැනිදා යළි කැඳවීමට නියමිතය.

05. **සිංහරාජයට ආසන්නයේ සිදු වන පරිසර විනාශයක් ගැන රූපවාහිනී වැඩසටහනකදී අදහස් පළ කළ භාග්‍යා අබේරත්න තරුණිය පොලිසියේ ප්‍රශ්න කිරීමට ලක් වීම.**

මාර්තු මස 13 වැනිදා සිරස රූපවාහිනී නාලිකාවෙන් ප්‍රචාරය වූ 'සිරස ලක්ෂපති' ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනට සහභාගී වූ රක්වානේ භාග්‍යා අබේරත්න තරුණිය, සිංහරාජ වනාන්තරය අවට ප්‍රදේශයේ සිදු වන පරිසර හානිය සම්බන්ධයෙන් අදහස් පළ කළාය. ඇයගේ නිවස ආසන්නයේ පිහිටා ඇති ඉඩමක හෝටලයක් ඉදි කිරීම ආශ්‍රිතව සිදු වන පරිසර හානියක් පිළිබඳ තොරතුරුද ඇගේ අදහස් දැක්වීමට ඇතුළත් විය. මෙම වැඩසටහන විකාශය වූ දිනට පසු දින (මාර්තු 14) භාග්‍යාගේ නිවසට ගිය රක්වාන පොලිසියේ නිලධාරීන් දෙදෙනකු ඇගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. ඉන් පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියකුද එහි ගොස් ඇය අපහසුවට පත් වන ආකාරයෙන් කරුණු විමසා තිබේ. මේ අතර භාග්‍යා අසත්‍ය ප්‍රකාශ කළ බව සඳහන් කරමින් සමාජමාධ්‍ය ඔස්සේ ඇයට එරෙහි ද්වේශසහගත හා තර්ජනාත්මක ප්‍රතිචාරද පළ විය.

මේ තත්ත්වය සම්බන්ධයෙන් මාර්තු 17 වැනිදා නිවේදනයක් නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, භාග්‍යාගේ අදහස් පළ කිරීමේ අයිතිය වෙනුවෙන් පෙනී සිටිමින්, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය අධෛර්යමත් කරන මෙවැනි ක්‍රියා වැළැක්වීමට කටයුතු කරන ලෙස රජයට අවධාරණය කළේය.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ විසම්මුතිය සමාජ වගකීමක් සහිතව භාවිත කිරීම හා එහි නිම්වළලු හා විෂය පථය පුළුල් කර ගැනීම පුරවැසි අයිතියක් බවත් රාජ්‍ය පාලන තන්ත්‍රයේ සෑම තරාතිරමකම බලධාරීන් අදහස් ප්‍රකාශ කිරීම ඇතුළු මාධ්‍ය නිදහසට ගරු කිරීමටත්, ආරක්ෂා කොට පෝෂණය කිරීමටත් ව්‍යවස්ථානුකූල මෙන්ම සදාචාරමය වගකීමකින්ද බැඳී සිටින බවත් එම නිවේදනය මගින් වැඩිදුරටත් අවධාරණය කෙරිණි.

06. 2021 **මාර්තු 19 වැනිදාට යෙදී තිබුණු ගෝලීය දේශගුණික විපර්යාස දිනය සැමරීම වෙනුවෙන් කොළඹ විහාරමහාදේවී උද්‍යානයේ සවි කර තිබූ චිත්‍රයක්, පොලිස් පරිසර කොට්ඨාසයේ සහ කොළඹ නාගරික කොමසාරිස්වරියගේ මැදිහත්වීමෙන් ගලවා ඉවත් කිරීම.**

Wildlife and Nature Protection Society (WNPS) විසින්, ගෝලීය දේශගුණික විපර්යාස දිනය සැමරීම නිමිත්තෙන් සංවිධානය කර තිබූ වැඩසටහන් මාලාවක අංගයක් ලෙස Stop Ecocide යන තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ අඩි 70x20 ප්‍රමාණයේ මෙම සිතුවමෙන් පරිසර

විනාශය හා එහි අහිතකර ප්‍රතිඵල පිළිබිඹු කර තිබිණි. WNPS සංවිධානයේ තරුණ ක්‍රියාකාරීන් වන, WNPS Youth Wing හි 100 දෙනෙකුට අධික තරුණ හා යොවුන් කණ්ඩායමක් සතියක පමණ කාලයක් මෙම චිත්‍රය නිර්මාණය කිරීම සඳහා ස්වේච්ඡාවෙන් කටයුතු කර තිබේ.

මුලදී පොලිසිය සමඟ පැමිණි පිරිසක් මෙම චිත්‍රය පුවරුවෙන් ඉවත් කරමින් සිටියදී, එය නිසි අවසරය මත සවි කරන ලද බව සංවිධායකයින් පෙන්වා දීම නිසා යළි සවිකර ඇතත්, පසුව එම ස්ථානයට පැමිණි පොලිස් පරිසර ඒකකයේ අධ්‍යක්ෂ රොහාන් රාජපක්ෂ සහ කොළඹ නාගරික කොමසාරිස් රෝහිණී දිසානායක එම පුවරුව පරිසරයට හානිකර වන බව ප්‍රකාශ කොට, පිරිසක් යොදවා එය ඉවත් කර ඇත. නීතිඥ ජගත් ගුණවර්ධන පෙන්වා දෙන්නේ පොලිසිය විසින් කරන ලද මෙම ක්‍රියාව නීතියට පටහැනි බවයි.

එමෙන්ම පොලිස් පරිසර ඒකකයේ අධ්‍යක්ෂ රොහාන් රාජපක්ෂ එම ස්ථානයේදී කළ ප්‍රකාශය සමාජ මාධ්‍ය තුළ දැඩි විවේචනයට ලක් වූ අතර "පරිසරය ගැන මෙවැනි කතාබහක් ඇති වී තිබෙන්නේ අපේ රජය බලයට පත් වුණාට පස්සේ" යනුවෙන් ඔහු කළ ප්‍රකාශය විශේෂයෙන් විරෝධයට හේතු විය.

Daily mirror වෙබ් අඩවිය වාර්තා කර තිබුණේ නිසි අවසරය මත ප්‍රදර්ශනය කරමින් තිබූ එම චිත්‍රය ඉවත් කර ඇත්තේ ජනාධිපති කාර්යාලයේ නියෝගයක් අනුව බවයි. https://bit.ly/2Qtghl2 ඊට පසුදා (මාර්තු 20) වලපනේ පැවති ගම සමඟ පිළිසඳර වැඩසටහනේදී ජනාධිපතිවරයාද එම චිත්‍රය ප්‍රදර්ශනය කිරීම ගැන විවේචනාත්මකව කතා කළේය. https://youtu.be/vJ7uMxLwx2c

07. **මාර්තු 20 වැනිදා නුවරඑළියේ පැවැති ගම සමඟ පිළිසඳර වැඩ සටහනට සහභාගී වෙමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනමාධ්‍යවලට කළ අනතුරු ඇඟවීම**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, යෝඹුවැල්තැන්න ප්‍රදේශයේදී මාර්තු 20 වැනිදා පැවැති ගම සමඟ පිළිසඳර වැඩ සටහනට සහභාගී වෙමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනමාධ්‍ය සම්බන්ධයෙන් දැඩි ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කළේය. https://youtu.be/vJ7uMxLwx2c

එහිදී ජනාධිපතිවරයා මෙසේ ප්‍රකාශ කළේය. ''ඒක මාෆියාවක්, අපේ රටේ රජවරු නැහැ, මහරාජලත් නැහැ. මහාරාජල හිටියෙ ඉන්දියාවේ. අයිතිකාරයාට ඕන විදිහට රට දුවන්න බෑ. පාලකයෝ පාලනය කරන්න හදනවා. ඒව මාත් එක්ක බෑ. මම දන්නව පාඩම් උගන්වන්න ඕන නම් උගන්වන්න. මම මාධ්‍ය නිදහස දීල තියෙනවා. කිසිම මාධ්‍යකට බලපෑම් කරල නෑ. වැරදි විදිහට පාවිච්චි කරන්න ආවොත් ඒවට නීති තියෙනව. ඒ මාධ්‍ය විතරක් නෙවෙයි, සමහර ජාතික චින්තනයේ මාධ්‍යයත් බොරු ප්‍රවෘත්ති දාල තියෙනව. යුද්ධ කාලෙ අපට විරුද්ධව වැඩ කළ අයත් ඒවයෙ ඉන්නව. ආපහු නැගිටලා"

මේ පිළිබඳව නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළුව මාධ්‍ය සංවිධාන 6ක් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරමින් අවධාරණය කළේ, ජනාධිපතිවරයාගේ ප්‍රකාශය අදහස් ප්‍රකාශ කිරීමේ සහ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් බරපතළ අනතුරක සේයාවක් මතු කරන අතර ආණ්ඩුවට එරෙහිව විවේචනාත්මකව අදහස් ඉදිරිපත් කරන මාධ්‍ය බියගැන්වීමකට ලක්කරන බවයි.

විශේෂයෙන්, "ඒව මාත් එක්ක බෑ, මම දන්නව පාඩම් උගන්නන්න. යුද්ධ කාලයෙ අපට විරුද්ධව වැඩ කළ අය ඒවයෙ ඉන්නව, ආපහු නැගිටලා" යනුවෙන් වන කොටස පසුගිය කාලසීමාවන්හිදී ජනමාධ්‍යයට සහ ජනමාධ්‍යවේදීන්ට මුහුණ දීමට සිදු වූ, තවමත් නොවිසඳුණු අපරාධ සිහිගන්වන බවද එම නිවේදනයේ සඳහන් වේ.

ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, තරුණ මාධ්‍යවේදීන්ගේ සංගමය, දෙමළ මාධ්‍ය සංසදය, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය සහ ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය යන මාධ්‍ය සංවිධාන එම නිවේදනයට අත්සන් තබා ඇත.

ජනාධිපතිවරයාගේ ප්‍රකාශයට ප්‍රතිචාර දක්වමින් නිවේදනයක් නිකුත් කරමින් SAFMA සංවිධානය පවසන්නේ මාධ්‍ය ව්‍යාපාර ඉලක්ක කිරීම මාධ්‍ය නිදහසට හානිකර වන අතර ජනතාවගේ තොරතුරු දැනගැනීමට සීමා පනවන බවයි. (Targeting of media businesses harms media freedom" curbs publicinfo)

https://bit.ly/31dogVk

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 5ක් මාර්තු මාසය තුළ නිරීක්ෂණය විය. එම සිදුවීම් නීතිමය ක්‍රියාමාර්ග, මාධ්‍ය නිදහසට බලපාන නව නීති පැනවීම, නීති ප්‍රතිසංස්කරණ යන උප ශීර්ෂවලට අයත් වේ.**

**3 වගුව: 2021 මාර්තු: නීතිමය කොන්දේසි - සිදුවීම් 05**

| අංකය | සිදුවීම | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 02 |
| 02 | නව නීති පැනවීම | 01 |
| 03 | නීති ප්‍රතිසංස්කරණ යෝජනා | 02 |
| | **එකතුව** | **05** |

## මාසය තුළ නව සිදුවීම්:

1. **අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීතිය කුමක්දැයි නිසි ලෙස අර්ථ නිරූපනය කරන ලද නීතියක් සම්පාදනය කරන ලෙස ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය අධිකරණ අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටීම.**

   වෙනත් බොහෝ රටවල පවතින ආකාරයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීතිය කුමක්දැයි නිසි ලෙස අර්ථ නිරූපනය කළ නීතියක් නොමැති බැවින් ඒ පිළිබඳ පනතක් සම්පාදනය කර බලාත්මක කිරීම සඳහා වන යෝජනාවලියක් අධිකරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා වෙත ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා කර්තෘ සංසදය සමඟ එක්ව ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය පියවර ගෙන ඇත.

   අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීතියට අදාළව එවැනි නිසි අර්ථ නිරූපනයක් සහිත නීති සම්පාදනය කිරීම දීර්ඝ කාලයක සිට පවතින අවශ්‍යතාවයක් බවද, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් අධිකරණ අමාත්‍යවරයා වෙත යොමු කළ ලිපියේ සඳහන් කර ඇත.

   ජනාධිපති නීතිඥ ලක්ෂ්මන් කදිරගාමර් මහතාගේ සභාපතීත්වයෙන් 2003 වසරේ දී පැවති පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් ඉදිරිපත් කළ යෝජනා පදනම් කරගනිමින් මෙම යෝජනා ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ උපදේශක කමිටුව විසින් 2006 දී සකස් කරන ලද අධිකරණයට අපහාස කිරීම පිළිබඳ පනත් කෙටුම්පතද ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් අධිකරණ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදි. එම වාර්තාවට ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ අදහස් ද ඇතුළත්ව ඇත.

   ශ්‍රී ලංකා පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ හවුල්කාර සංවිධාන වේ. එහි අනුබද්ධ හවුල්කරුවන් වන්නේ ශ්‍රී ලංකා දෙමළ මාධ්‍ය සංවිධානය, ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය සහ දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සංගමයේ - ශ්‍රී ලංකා පාර්ශ්වයයි.

2. **ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත ප්‍රතිසංවිධානයට දැඩි සේ විරෝධය පළ කරමින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යවන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය එම පනත අහෝසි කළ යුතු බව අවධාරණය කිරීම.**

   මාධ්‍ය නිදහසට දැඩි සේ හානිකර නීතිමය අවරණයන් සහිත, වසර පනහක් තරම් පැරණි යල්පැන ගිය නීතියක් වන පුවත්පත් මණ්ඩල පනත ප්‍රතිසංවිධානයට දැඩි සේ විරෝධය පළ කරමින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යවන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය එම පනත අහෝසි කරන ලෙස අවධාරණය කර සිටී. 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත මගින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ව්‍යුහාත්මක ලෙස ප්‍රතිසංස්කරණය කර විද්‍යුත්, මුද්‍රිත හා නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන පිළිබඳව විනිශ්චය ආයතනයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා මහජන අදහස් විමසමින් ලේකම්වරයා විසින් පළ කරන ලද දැන්වීමට ප්‍රතිචාර වශයෙන් මෙම ලිපිය යොමු කර තිබේ.

   හානිකර නීතිමය ප්‍රතිපාදන සහිතව, රජයේ ආයතනයක් විසින් ඒකපාර්ශ්විකව සිදුකරනු ලබන මාධ්‍ය නියාමන ක්‍රියාවලියකට දීර්ඝ කාලයක් තිස්සේ තමන් විරෝධය පළ කර ඇති බව සිහිපත් කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තම සංවිධානයේ එකඟතාව ඇත්තේ මාධ්‍ය ප්‍රජාවගේ මැදිහත් වීමෙන් සිදු කරනු ලබන මාධ්‍ය විවිධත්වය, ස්වාධීනත්වය, නිදහස සහ සමාජ වගකීම ආරක්ෂා වන, සියලු මාධ්‍ය ආවරණය වන ''සහ නියාමන'' ක්‍රමවේදයකට බවද අවධාරණය කරයි. පුවත්පත් මණ්ඩලයට විරුද්ධ වීමට හේතු වන අහිතකර නීතිමය ප්‍රතිපාදන මොනවාද යන්න එම ලිපියෙන් විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

3. **2021 මාර්තු 12 දරන ගැසට් පත්‍රය මගින්, 2021 අංක 1 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (දැඩි අන්තවාදී ආගමික මතවාද දැරීමෙන් මුදවා ගැනීමේ) නියෝග ප්‍රකාශයට පත් කිරීම**

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාවේ (ආ) ඡේදය සමග කියවිය යුතු 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත නියෝග පනවා තිබේ. මෙම නියෝග මගින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලබන සැකකරුවකු නඩු පැවරීමෙන් තොරව පුනරුත්ථාපන

ක්‍රියාවලියකට යොමු කිරීමට හැකි වන අතර එම කාලය වසර දෙකක් දක්වා දීර්ඝ කළ හැකිය. මෙම නව රෙගුලාසි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇතුළු අයිතිවාසිකම්වලට එරෙහිව භාවිත වීම පිළිබඳ ගැටලුකාරී තත්ත්වය තවදුරටත් උත්සන්න කරන බවට විවේචනයට ලක්ව තිබේ.

මේ පිළිබඳව අදහස් පළ කරන හියුමන් රයිට්ස් වොච් සංවිධානය පවසන්නේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පනවා ඇති නව රෙගුලාසි මඟින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස අසීමිත ලෙස සීමා කරන බවයි.

නඩු විභාගයකින් තොරව වසර දෙකක් දක්වා අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීමට ඉඩ සලසන ශ්‍රී ලංකාවේ නව රෙගුලාසි හෙළා දකින බව නීතිවේදීන්ගේ ජාත්‍යන්තර කොමිසම හෙවත් ICJ සංවිධානය පවසයි. එම රෙගුලාසි මගින් සුළුතර ආගමික හා ජනවාර්ගික ප්‍රජාවන් වෙනස් කොට සැලකීමට භාජනය වන ආකාරයෙන් ඉලක්ක කළ හැකි බවද එම සංවිධානය පෙන්වා දෙයි.

පාර්ලිමේන්තුවේ මැදිහත්වීමකින් තොරව විධායකය විසින් පනවන ලද මෙම රෙගුලාසි මගින් පුද්ගලයන් නඩු විභාගයකින් තොරව සිරගත කිරීමට ඉඩ සලසන බවත් එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය සහතික කිරීම් මෙන්ම ජාත්‍යන්තර නීතිමය බැඳීම් උල්ලංඝනය කිරීමක් බවත් එම සංවිධානය ප්‍රකාශ කරයි.

4. **යාපනයේ පිහිටි tubetamil යූ ටියුබ් නාලිකාව සහ www.tubetamil.com වෙබ් අඩවියේ කාර්යාලය වටලා එම මාධ්‍යවලට සම්බන්ධ දෙදෙනෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම.**

මාර්තු 29 වැනිදා යාපනය නගරයේ නාවර් වීදියේ පිහිටි tubetamil යූ ටියුබ් නාලිකාව සහ www.tubetamil.com වෙබ් අඩවියේ කාර්යාලය වටලා එම මාධ්‍යවල සේවය කරන 35 හැවිරිදි කාන්තාවක සහ 36 හැවිරිදි පුරුෂයකු අත්අඩංගුවට ගත් බවත්, ඒ සමඟ කාර්යාලයේ තිබූ ඩෙක්ස්ටොප් පරිගණක 5ක්, ලැප්ටොප් පරිගණක 5ක් සහ තවත් උපකරණ පොලිසිය භාරයට ගත් බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නි. පොලිස්පති අජිත් රෝහණ මාධ්‍ය වෙත ප්‍රකාශ කළේය

පොලිස් ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසය විසින් සිදුකළ විමර්ශනයකින් අනතුරුව ඉහත යූ-ටියුබ් නාලිකාව හා වෙබ් අඩවිය මඟින් ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කරමින් විවිධ පුවත් පළ කරන බව තහවුරු වූ බැවින් මෙම අත්අඩංගුවට ගැනීම සිදු කළ බවත් වැඩිදුර විමර්ශන සඳහා ඔවුන් කොළඹ ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසය වෙත රැගෙන එන බවත් රැඳවුම් නියෝග මත ඔවුන් රඳවා තබාගෙන ප්‍රශ්න කිරීමට බලාපොරොත්තු වන බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.

පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා මාධ්‍යයට කළ ප්‍රකාශය - https://bit.ly/3suSorn

අත්අඩංගුවට ගැනීම ගැන tubetamil යූ ටියුබ් නාලිකාව පළ කළ පුවත - https://bit.ly/3m22iy8

## පෙර සිදුවීම්වල වර්ධනයන්:

1. **උදයන් පුවත්පතේ කළමනාකාර අධ්‍යක්ෂ සරවනපවන් සහ සහ එම කාර්යමණ්ඩලයේ කේ. දිලිප් අමුතන් යන දෙදෙනා, යාපනය මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පැවති නඩුවක චූදිත තත්ත්වයෙන් නිදහස් කිරීමට මහහේස්ත්‍රාත්වරයා නියෝග කිරීම.**

2020 දෙසැම්බර් 26 වැනිදා, එල්ටීටීඊ සංවිධානයේ හිටපු නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ ඡායාරූපයක් උදයන් පුවත්පතේ පළ කළේය යන චෝදනාව මත උදයන් පුවත්පතේ කළමනාකාර අධ්‍යක්ෂ සරවනපවන් සහ සහ එම කාර්යමණ්ඩලයේ කේ. දිලිප් අමුදන් යන දෙදෙනාට එරෙහි නඩුවක් යාපනය පොලිස් ස්ථානාධිපති ප්‍රසාද් ප්‍රනාන්දු විසින් යාපනය මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර තිබිණි. මහවිරු දිනය සැමරීමට එරෙහිව අධිකරණයෙන් ලබාගත් තහනම් නියෝගය උල්ලංඝනය කිරීම ඔවුන්ට එරෙහිව නඟා තිබුණු චෝදනාවයි.

මෙම නඩුව මාර්තු 19වැනිදා කැඳවූ අවස්ථාවේදී ඉහත දෙදෙනා තවදුරටත් සැකකරුවන් ලෙස නොසැලකෙන පරිදි නඩුවෙන් නිදහස් කිරීමට මහේස්තාත්වරයා නියෝග කර ඇත. අදාළ නඩුව පිළිබඳ නීතිපතිවරයාගෙන් උපදෙස් ලබා ගැනීම සඳහා කාලය අවශ්‍ය බව පොලිසිය ප්‍රකාශ කළද මහේස්ත්‍රාත්වරයා පවසා ඇත්තේ පොලිසියට විමර්ශන ඉදිරියට ගෙන යෑමට බාධාවක් නැති නමුත් ඉහත සැකකරුවන් තවදුරටත් සැකකරුවන් ලෙස කැඳවනු නොලබන බවයි. නමුත් ඔවුන් දෙදෙනාම උසාවියට කැඳවන සෑම අවස්ථාවකම අධිකරණයට පැමිණිය යුතුය. මීළඟ නඩු විභාගය ජූලි 16 වන දින පැවැත්වේ.

## ජනමාධ්‍යයට අදාළ වැදගත් ප්‍රවණතා

1. **ෆේස්බුක් සමාගම, ආයතනික මානව හිමිකම් ප්‍රතිපත්තියක් සහ මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට ආධාර කිරීමේ අරමුදලක් ප්‍රකාශයට පත් කිරීම.**

2020-03-16 වැනිදා ෆේස්බුක් සමාගම, ආයතනික මානව හිමිකම් ප්‍රතිපත්තියක් සහ මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට ආධාර කිරීමේ අරමුදලක් ප්‍රකාශයට පත්

කළේය. සමාජ මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ඉතා වැදගත් ඉදිරි පියවරක් ලෙස එය පැසසුමට ලක්ව තිබේ. මෙම පියවරෙහි අරමුණ විස්තර කරමින් නිවේදනයක් නිකුත් කරන ෆේස්බුක් සමාගම පවසන්නේ සිය ව්‍යාපාර මෙහෙයුම්, නිෂ්පාදන සංවර්ධනය, ප්‍රතිපත්ති සහ වැඩසටහන්කරණයේදී මානව හිමිකම්වලට ගරු කිරීමට තමන් කැප වී සිටින අතර එම කැපවීම තවදුරටත් වර්ධනය කිරීම මෙහි අරමුණ බවයි. https://bit.ly/30SegAF 'ආරක්ෂාව, අභිමානය සහ නිදහසේ අදහස් පළ කිරීමේ අයිතිය, මානව හිමිකම්වල මූලික මූලධර්ම සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මග පෙන්වීම්වලට ගරු කරන පද්ධතියක් ගොඩනැගීම' සිය අපේක්ෂාව බවද ෆේස්බුක් සමාගම සඳහන් කරයි.

ෆේස්බුක් සමාගමේ පියවර අගය කරමින් නිවේදනයක් නිකුත් කරන Access Now සංවිධානය, ෆේස්බුක් හි නව මානව හිමිකම් ප්‍රතිපත්තිය සාදරයෙන් පිළිගන්නා බවත් එය මානව හිමිකම්වලට ගරු කිරීමට අපේක්ෂා කරන සෑම සමාගමකටම අත්‍යවශ්‍ය පියවරක් බවත් සඳහන් කරයි. 'නමුත් ෆේස්බුක් වැනි විශාල හා බලවත් සමාගමකින් මෙම මූලික ප්‍රකාශය අපේක්ෂාවෙන් බලා සිටීමට සිදු වූ කාලය අවුරුදු 17ක් තරම් බෙහෙවින් දිගු එකක් බව'ද එම නිවේදනයේ සඳහන් වේ. https://bit.ly/3eUrq8N

**4 වගුව: මාධ්‍ය නිදහස: 2021 ජනවාරි - මාර්තු දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම් සංඛ්‍යාව**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - පෙබරවාරි | 2021 මාර්තු |
|---|---|---|
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 06 | 07 |
| නීතිමය කොන්දේසි | 09 | 05 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 01 | |
| එකතුව | **16** | **12** |

2021 ජනවාරි මාධ්‍ය නිදහස - නිරීක්ෂණ වාර්තාව https://bit.ly/3wqcdCx

2021 පෙබරවාරි මාධ්‍ය නිදහස වාර්තාව https://bit.ly/2PsErw0

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙළ කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.

Free Media Movement

Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25